# 4 පාඩම

## ආඛ්‍යාත පද

වාක්‍යයක අවසානය හඟවන ක්‍රියා පද ආඛ්‍යාත පද නමින් හඳුන්වයි. මෙහි ප්‍රභේද කිහිපයකි.

I. ආශිර්වාදක්‍රියා

යම් යහපත් හෝ අයහපත් ප්‍රාර්ථනාවක් හැඟවෙන ක්‍රියා පද ආශිර්වාද ක්‍රියාය.

II. ප්‍රයෝජ්‍යක්‍රියා

වෙනත් අයෙකු ලවා කරවනු ලබන ක්‍රියා ප්‍රයෝජ්‍ය ක්‍රියා ගණයට අයත්ය. ''ධාතුව හා ප්‍රත්‍යය අතරට ව ප්‍රත්‍යය'' එක් කොට මෙය තනා ගනියි.

The National e-learning Portal for The General Education

4.I.රූප සටහන්වලට අදාළ ආශිර්වාද ක්‍රියා පද සහ ප්‍රයෝජ්‍ය ක්‍රියා පද සහිත වාක්‍යය පින්තූරය ඉදිරියෙන් යොදන්න



සුවපත් වෙයි

සුවපත් වේවා

සුවපත්වනු



ජය ගනියි

ජය ගත්තේය

ජය වේවා



ගුරුවරයා අකුරු ලියයි

ගුරුවරයා ශිෂ්‍යයා ලවා අකුරු ලියවයි

ශිෂ්‍යයා අකුරු ලියයි

ශිෂ්‍යයා ගුරුවරයා ලවා අකුරු ලියයි



සේවකයා වැඩ කරයි

ස්වාමියා වැඩ කරයි

ස්වාමියා සේවකයාලවා වැඩ කරවයි

සේවකයා ස්වාමියා ලවා වැඩ කරවයි

පහත වචන ගොනුවෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියා හා ආශිර්වාද ක්‍රියා තෝරා අදාළ භාජන වෙත යොදන්න.







